ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් පිරිවැය රු.7,206,736 ක් වූ නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි ගොඩනැගිල්ල හැර අනෙකුත් ගොඩනැගිලි පමණක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණි.	2016 වර්ෂයේදී තක්සේරු කරන ලද අවස්ථාවේදී ඉඩමේ අයිතිය පිළිබඳව තිබුණු ගැටළුවක් මත ගිණුම්වලට ඇතුළත් නොකරන ලද අතර මේ වන විට එම ගැටළු විසදී ඇති බැවින් නව තක්සේරු වාර්තා ලැබුණු පසු ඉඩමේ වටිනාකම ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. කෙසේ වෙතත්, මේ වන විට ඉඩම හා ගොඩනැගිලි හැර අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කර අවසාන මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇත.	ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව වත්කම් පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.25,203,016 ක් හා ඉකුත් වර්ෂවල ලැබූ තිබුණු භාණ්ඩාගාර ප්‍රදානයන් ක්‍රමක්ෂය කිරීමෙන් අනතුරුව ඉතිරිව තිබූ රු.491,907,397ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව හුවමාරු නොවන	2025 වර්ෂයට අදාළ ගිණුම් පිළියෙල කිරීමේදී රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 අනුව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ.	ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව ප්‍රදාන හා වත්කම් ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.

	ගණුදෙනුවලින් ලද ආදායම් ලෙස ගිණුම්ගත කළයුතු වුවත් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම්ගත කර තිබුණු අතර එම ප්‍රදානයන්ට අදාළ සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය වටිනාකම රු.19,963,739ක් ගැලපීමෙන් පසු 2024 දෙසැම්බර් 31 දිනට රු.497,146,674ක් විලම්භිත අයහාර ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.		
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 76 ඡේදය ප්‍රකාරව රු.34,507,720 ක් වූ පාරිතෝෂිත වෙන් කිරීම්වලට අදාළ පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳියාව සහ සම්බන්ධිත ප්‍රවර්තන සේවා පිරිවැයෙහි වර්තමාන අගය ගිණුම්වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 19 පරිදි ගණනය කිරීම සඳහා අවශ්‍ය අනාගත දත්ත (වැටුප් වැඩිවීම්, වට්ටම් අනුපාත, සේවක පිරිවැටුම වැනි උපකල්පිත දත්ත) ලබාගැනීමේ විශේෂඥ දැනුමක් හෝ එම දත්ත අප සතුව නොමැති අතර, මේ සම්බන්ධයෙන් වරලත් ගණකාධිකරණ ආයතනය හෝ මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබාගෙන ඒ, අනුව 2025 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ කටයුතු කරනු ලැබේ.	ප්‍රමිතය ප්‍රකාරව පශ්චාත් සේවා ප්‍රතිලාභ ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් 2016 වර්ෂයේ දී නිදහස් දීමනාවක් ලෙස ආයතනය වෙත පවරා දී තිබූ නුවරඑළිය සංචාරක බංගලාව සඳහා වූ ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	තක්සේරු වාර්තාව ලැබීමෙන් පසු අදාළ වටිනාකම් සඳහා ගිණුම් සටහන් තැබීමේ කටයුතු සිදු කර 2025 මූල්‍ය වාර්තාවන් හි ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.	ආයතනය සතු සියළු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.
(ආ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.12,804,809ක් වූ බොල් ණය වෙන්කිරීම් දැක්වීමේදී, ලැබිය යුතු දැවලින් අඩුකර ශුද්ධ අගය දැක්වීම වෙනුවට ජංගම වගකීම් යටතේ දක්වා තිබීමෙන් ජංගම වත්කම් හා ජංගම වගකීම් එම	ඉදිරියේදී මෙම අගයන් වෙන වෙනම ගලපා ණයගැතියන්ගේ ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	ජංගම වත්කම් හා ජංගම වගකීම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුය.

ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පශ්චාත් උපාධි පාඨමාලා හැරගිය 55 දෙනෙකුගෙන් රු.11,578,750 ක පාඨමාලා ගාස්තු වර්ෂ 03-05 ත් අතර කාලයක සිට ද, භාෂා පාඨමාලා හැරගිය නිලධාරීන් 46 දෙනෙකුගෙන් රු.1,091,027 ක පාඨමාලා ගාස්තු වර්ෂ 01-05 ත් අතර කාලයක සිට ද නිරවුල් කිරීමට කටයුතු නොකර අයවිය යුතු ශේෂ ලෙස තවදුරටත් දක්වා තිබුණි.	මෙම ඇස්තමේන්තුගත ආදායම්, ගිණුම්වලින් කපාහැරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. මෙම කපා හැරීම් සඳහා සම්පූර්ණයෙන් වෙන් කිරීම් 2024 මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කර ඇත.	අය නොවන ආදායම් නිරවුල් කරගෙන ගිණුම්වලට ගැළපීම් කළ යුතුය.
(ආ)	වර්ෂ 06කට වැඩි කාලයක සිට අයනොවී පවතින රු.1,752,771ක විවිධ ලැබිය යුතු ශේෂ 11ක්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම ශේෂ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ තවදුරටත් තොරතුරු පරීක්ෂා කිරීම සහ නිර්දේශ ලබා ගැනීමට විගණන හා කළමනාකරණ කමිටුවට යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.	අය නොවන ශේෂ නිරවුල් කරගෙන ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු ගිණුම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පුහුණු පාඨමාලා හා විභාග පැවැත්වීම වෙනුවෙන් විවිධ රාජ්‍ය ආයතනවලින් ලැබී තිබුණු වසර 03 -05 අතර කාලයක සිට පැවත එන රු.3,289,670ක් වූ ශේෂ නිරවුල් නොකර ගෙවිය යුතු ශේෂ ලෙස පෙන්වා තිබුණි.	අවුරුදු 5කට වැඩි රු.2,549ක ශේෂයක් ආපසු ගෙවීමට නියමිතය. රු.3,287,119ක මුදලක් ප්‍රසම්පාදන ඩිප්ලෝමාවට අදාල වන අතර එය වසර 3 ත් 5 ත් අතර කාලපරිච්ඡේදයට අයත් වේ. ඊට අදාල අවසාන වියදම් වාර්තා ගිණුම්ගත කිරීමට ඉදිරිපත් කළ පසු නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1997 අංක 22 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන (සංශෝධන) පනතෙහි 2(5) (ඌ), (එ) වගන්ති	ආයතනයේ පාලක මණ්ඩලයට අමාත්‍යවරයා විසින් පත්කළ යුතු නිලධාරීන් පත්කර නොතිබුණි.	පාලක මණ්ඩලයේ උපදෙස් පරිදි ගරු අමාත්‍යවරයා විසින් පත්කළ යුතු පාලක මණ්ඩල සාමාජිකයින් පත්කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත වාචිකව හා ලිඛිතව දැනුම් දී ඇත.	පනතේ විධිවිධාන ප්‍රකාරව පාලක මණ්ඩලය පත්කර තිබිය යුතුය.
(ආ)	1971 අංක 38 දරන මුදල් පනතේ 10(05) වගන්තිය	විසර්ජනයකින් පසු ඉතිරි වන ශුද්ධ ආදායම ඒකාබද්ධ අරමුදලට යැවිය යුතු වුවත් ආයතනය එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.	ශුද්ධ අතිරික්තයක් ලෙස රු.28,610,370ක් පෙන්නුම් කරනුයේ ආයතනයේ සේවක පාරිශ්‍රමික ගෙවීම් සිදුකරීමට මහා භාණ්ඩාගාරය විසින් ලබාදුන් රු.150,000,000ක මුදල් ප්‍රදානයන් ද සැලකිල්ලට ගනිමින්ය. ප්‍රදානයන් නොලැබෙන්නේ නම් ඉදිරියේදී මූල්‍ය තත්වය අසතුටුදායක වන බැවින් මෙම තත්වය සම්බන්ධයෙන් ඉදිරියේ දී පාලක මණ්ඩලය හා භාණ්ඩාගාරය සමහ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.	මුදල් පනත අනුව විසර්ජනයෙන් පසු ශුද්ධ ආදායම ඒකාබද්ධ අරමුදලට යැවිය යුතුය.
(ඇ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2(1) හා 102 වගන්ති	ආයතනය ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	බදු බැඳියාව සම්බන්ධයෙන් ආයතනයේ පනත සහ වසර කිහිපයක අවසාන ගිණුම් වාර්තාද ඇතුළත්ව තොරතුරු වාර්තාවක්	බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට කටයුතු කළ යුතුය.

			දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම පරිමාණ සංස්ථාපිත අංශය - 01 වෙත ලබාදී ඇති අතර, බදු බැදියාව සම්බන්ධයෙන් මේ වන තෙක් කිසිදු දැනුම් දීමක් සිදුකර නොමැත. කෙසේ වෙතත් නැවත දෙපාර්තමේන්තුවෙන් විමසා ඒ අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ.	
(ඇ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**			
i.	මුදල් රෙගුලාසි 763	භාණ්ඩ භාර ගැනීම, සතුටුදායක ලෙස ගබඩාකර තැබීම, භාරය හා සුදුස්සක් කොට බැහැර කිරීම, සම්බන්ධ ක්‍රියාපටිපාටි අනුගමනය කළ යුතු වුවත් ආයතනය සතු ගබඩා 06 ක් සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි.	විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ මත වත්කම් ලේඛන සැකසීම, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් පසු විධිමත් අපහරණ ක්‍රියාවලිය ඉටු කිරීම යන කරුණු සිදු කිරීමට කටයුතු යොදමින් පවතින බැවින් මේ වන විට ගබඩා සම්බන්ධ අභ්‍යන්තර පාලනය විධිමත්ව ඉටු කිරීමට අවශ්‍ය විධිවිධාන යොදා ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ගබඩා පාලන කටයුතු ඉටු කළ යුතුය.
ii.	මුදල් රෙගුලාසි 880	ආයතනයේ ඇප තැබිය යුතු නිලධාරීන් ඇප ආඥා පනතට අනුකූලව ඇප තබා නොතිබුණි.	ඉදිරියේදී පනතෙහි සිදුකරන සංශෝධනවලින් පසු ඇප තැබීම සඳහා අනුමත වන පනත මගින් ලබා දෙන නිර්දේශයන් මත ඉදිරියේදී ගබඩා භාරකරු හෝ ගබඩාව සම්බන්ධ වගකීම් පවරන නිලධාරීන් වෙතින් ඇප තැන්පත් කිරීමේ කාර්යය	ඇප තැබිය යුතු නිලධාරීන් වෙතින් ඇප අයකර ගත යුතුය.

			ඉටු කරවා ගත හැකි වනු ඇත.	
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන අත්පොතේ 2.6.3(උ) වගන්තිය සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8(අ), 6.2.1(අ)(vi) සහ 9.3 මාර්ගෝපදේශ	2024 පෙබරවාරි 22 දින රු.2,000,000ක් වූ වැඩසටහන් පරිපාලක පද්ධතියක් මිලදී ගැනීම සඳහා උපදේශකවරයෙකු තෝරා ගැනීමේ දී ප්‍රසම්පාදන අත්පොතේ උපදෙස් හා මාර්ගෝපදේශවලින් බැහැරව කටයුතු කර තිබුණි.	ඉදිරි උපදේශන ප්‍රසම්පාදන කටයුතුවලදී දක්වා ඇති පරිදි කටයුතු කරනු ලැබේ.	මිලදී ගැනීම් සම්බන්ධව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඊ) අමාත්‍ය මණ්ඩල තීරණ

	i. 2013 පෙබරවාරි 07 දිනැති අංක 13/0150/523/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය	ආයතනය පිහිටවනු ලැබූ පනත සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද එය සිදුකර නොතිබුණි.	1982 අංක 9 දරන පනත සංශෝධනය කිරීම සඳහා ජ්‍යෝෂ්ඨ උපදේශක වරයෙකුගෙන් සමන්විත ඒක පුද්ගල කමිටුවක් පත් කර ඇත. මේ අනුව වර්තමානයට උචිත පරිදි ඉදිරිපත් කරනු ලබන කමිටු නිර්දේශ අනුව පනත සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.	වර්තමානය වන විට තනතුරුවල සිදුකර තිබෙන වෙනස්කම්ද ආයතනයේ විෂය පථයේ සිදුකර ඇති වෙනස්කම්ද ඇතුළත්ව පනතට අවශ්‍ය සංශෝධනයන් සිදුකළ යුතුය.
	ii. 2013 අප්‍රේල් 19 දිනැති අංක 13/0237/523/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය	1. ආයතනය පිහිට වූ පනතට කරනු ලබන සංශෝධනවලට යටත්ව වහාම ක්‍රියාත්මක වන පරිදි ආයතනයේ අධ්‍යක්ෂ තනතුර අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් ද අතිරේක අධ්‍යක්ෂ තනතුර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්ද	1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ “අධ්‍යක්ෂ” තනතුරු නාමය පිලිබඳව පමණක් සටහන් කර ඇති බැවින් “අධ්‍යක්ෂ” තනතුර “අධ්‍යක්ෂ ජනරාල්” ලෙස ඉදිරියේ දී පනත සංශෝධන කිරීමේ දී සංශෝධනය කිරීමට කටයුතු කෙරේ. අනෙකුත් තනතුරු හා වැටුප් කේතයන්හි	වර්තමානය වන විට තනතුරුවල සිදුකර තිබෙන වෙනස්කම්ද ආයතනයේ විෂය පථයේ සිදුකර ඇති වෙනස්කම්ද ඇතුළත්ව පනතට අවශ්‍ය සංශෝධනයන් සිදුකළ යුතුය.

	උත්ශ්‍රේණිගත කිරීමට අනුමැතිය ලබා දී තිබුණද අධ්‍යක්ෂ ජනරාල් තනතුර හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 06ක් පනතට අදාළ සංශෝධනයන් සිදුකිරීමකින් තොරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය මත ක්‍රියාත්මක කර තිබුණි.	වෙනස් වීම් සම්බන්ධව සංශෝධනයන් සිදු කිරීමට අදාළ වගන්ති පනතෙහි සඳහන්ව නොමැති බැවින් බඳවා ගැනීම් පරිපාටිවල අදාල සංශෝධනයන් සිදුකර ඇත.	
2.	ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ද ස්ථිර පදනමින් හෝ කොන්ත්‍රාත් පදනමින් අධ්‍යයන කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමට කටයුතු කළයුතු වුවද බඳවා ගැනීම් ද්විතියියන පදනම මත සිදුකර තිබුණි.	2024 වසරේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ උපදේශක හා සහාය උපදේශක තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන ලදී. එම අයදුම්පත් අතර උපදේශන තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසකම්ලත් අයදුම්පත් නොතිබුණි. භාෂා අංශයේ සේවා අවශ්‍යතාවය අනුව එම අංශයට සහකාර උපදේශකවරයෙකු ස්ථිර පදනමින් බඳවා ගෙන ඇත. තවද සහාය උපදේශක කනතුර සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීමට අදාළ තරඟ විභාගය මේ වන විට පවත්වා ඇත. එහි ප්‍රතිඵල ලද පසු එම උපදේශකයන් බඳවා ගැනීමට නියමිතය.	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව බඳවා ගැනීම් කළ යුතුය.

3.	ආයතනයේ මූලික අරමුණ රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම වන අතර ඒ සඳහා සියලුම සේවාවලට අයත් රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් සැලසුම් කළ යුතු වුවද එසේ කර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2024 දෙසැම්බර් 17 දිනැති ලිපිය මඟින් එම අමාත්‍යාංශය යටතේ පිහිටවා තිබූ රාජ්‍ය සේවා පුහුණු ආයතනය නැවත ස්ථාපනය කර විධායක නොවන නිලධාරීන් පුහුණු කිරීම සම්බන්ධව සාකච්ඡා මට්ටමේ පවතින බව දන්වා තිබුණි.	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහා වැඩසටහන් සැලැසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.
4.	ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලාවන්හි අන්තර්ගතය, පුහුණුවීම් ක්‍රමවේද විමර්ශනයට ලක්කොට ඒවා යලි සැකසීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, වර්ෂ 11ක් පමණ ගතව තිබුණද අදාළ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතින් අදාල වාර්තා ලබා ගත යුතු බැවින් මේ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස 2024 අගෝස්තු 23 දිනැති ලිපිය මගින් අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් උපදෙස් විමසා ඇත.	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පුහුණු පාඨමාලා සම්බන්ධව වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 28,610,370 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.61,548,388 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 32,938,018ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රදාන රු.26,205,524 කින් සහ ධාරිතා පුහුණු වැඩසටහන් හා උපදේශන සේවා ආදායම් එකතුව රු.33,093,555 කින් වැඩි වී තිබුණ ද ආයෝජන ආදායම් හා විවිධ ආදායම් රු.49,650,407කින් අඩුවීමත් සේවක පාරිශ්‍රමික, රු.30,600,296 කින් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
උපදේශකයින්ට ද්විතියීයන අධ්‍යයන දීමනාව මූලික වැටුපෙන් සියයට 50ක් ලබාගැනීමට හා බාහිර උපදේශන හා විභාග කටයුතුවලින් අතිරේක දීමනාවක් ලැබීමට මසකට දේශන පැය 45ක් සම්පූර්ණ කළයුතු බවට වූ එතෙක් පැවැති ක්‍රමවේදය, 2024 මාර්තු 28 දිනැති අංක 340.07 දරන පාලක මණ්ඩල තීරණය මඟින් වෙනස් කර තිබුණි. හඳුන්වා දී තිබූ නව ක්‍රමවේදයට අනුව, උපදේශකයින්ට පුහුණු දේශන පැය 20 ක් සහ මුදල් අයකර පවත්වනු ලබන වෙනත් කාර්යයන් ද ඇතුළත්ව මසකට පැය 140 ක් සම්පූර්ණ කිරීම තුළින් සිය කාර්යසාධනය සම්පූර්ණ කළහැකි වේ. එසේ වුවද, නව ක්‍රමවේදය තුළ මසකට ආයතනික දේශන පැය 20කට අඩුවෙන් සම්පූර්ණ කර තිබූ උපදේශකයින් 14 දෙනෙකු සඳහා රු.3,280,550 ක් ද, ආයතනිකව මසකට එක් දේශන පැයක්වත් සම්පූර්ණ නොකළ උපදේශකයින් 07 දෙනෙකු සඳහා රු.881,433 ක් ද, ද්විතියීයන දීමනා ගෙවා තිබුණි. තවද, මෙම උපදේශකයින්ට බාහිර දේශන හා අනෙකුත් ගාස්තු වෙනුවෙන් රු.3,483,572ක් ගෙවා තිබුණි.	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලයකින් වෙනස් වූ රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරීන්ගේ වෘත්තීය පුහුණු ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන හෙයින් මෙම ආයතනය වෙත පුහුණුව සඳහා යොමුවන විවිධ දීප ව්‍යාප්ත සේවාවන්ගේ විශේෂිත අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා මෙන්ම ආවරණය කළ යුතු විවිධ විෂයන් සඳහා විශේෂඥ දැනුමක් සහිත සම්මිශ්‍රණයක් මෙම ආයතනය විසින් සියළුම අවස්ථාවන්හිදී පවත්වාගෙන යා යුතුය. උපදේශකවරුන්ගේ කාර්යසාධන ඇගයීමේ දී ආයතනික දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගැනීම සඳහා ඉටුකර ගත යුතු සියළු කාර්යයන් සැලකිල්ලට ගැනීම යෝග්‍ය බව පාලක සභාව විසින් හඳුනාගෙන ඇත. එම සංශෝධන ක්‍රමවේදය අනුව ඉහත දක්වා ඇති සියලු කාර්යයන් සඳහා උපදේශකවරයකුගේ අවම රාජකාරි නියුක්තිය මසකට පැය 140ක් විය යුතු බවට නිගමනය කර ඇත. එම ක්‍රමවේදය පර්යේෂණ මට්ටමෙන් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.	නිශ්චිත හා යෝග්‍ය නිර්නායක මත පදනම්ව උපදේශකවරුන්ගේ කාර්යසාධනය වාර්ෂිකව ඇගැයීම් කළ යුතුය.

3.2 වත්කම් ඌන උපයෝජනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2016 වර්ෂයේදී ආයතනය තුළ ස්ථාපිත කර තිබුණු කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා රු.9,870,120ක් වූ උපකරණ මිලදීගෙන තිබුණු අතර, එම උපකරණ නඩත්තු කිරීම සහ සේවා කිරීම සඳහා ගිවිසුමකට ඇතුළත්ව නොතිබුණි. මධ්‍යස්ථානය සඳහා කාය වර්ධන උපදේශකයෙකුගේ සහාය ලබාගෙන නොතිබුණු අතර, මිලදීගෙන තිබුණු උපකරණ වැසි ජලය කාන්දුවන ගොඩනැගිල්ලක ඌන උපයෝජිතව පැවතුණි.	කායවර්ධන මධ්‍යස්ථානය පිහිටා ඇති ගොඩනැගිල්ලේ වහලය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	වත්කම්වල පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රියාමාර්ග ගතයුතු අතර වත්කම් ප්‍රශස්ථ අයුරින් උපයෝජනය කළ යුතුය.

3.3 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර පැවතුණ ද ඒ සඳහා කාර්ය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණු අතර අභ්‍යන්තර විගණකගේ සහාය කාර්ය මණ්ඩලය ලෙස එක් නිලධාරියෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.	ආයතනයේ සේවා අවශ්‍යතාවය අනුව එක් එක් අංශ සඳහා කාර්යය මණ්ඩලය අනුයුක්ත කර ඇත. තවද, අභ්‍යන්තර විගණන අංශයට සේවා අවශ්‍යතාවය අනුව දෛනික වැටුප් ලබන විශ්ව විද්‍යාල හා තාක්ෂණ විශ්ව විද්‍යාලවල රැකියාස්ථ පුහුණුව සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලනයට අනුයුක්ත කර ඇති ශිෂ්‍යයන් ද යොදවා ඇත.	අභ්‍යන්තර විගණන ඒකකය සඳහා කාර්ය මණ්ඩලය අනුමත කරගෙන ඒ අනුව සේවකයින් අනුයුක්ත කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 166ක් හා තථ්‍ය කාර්යය මණ්ඩලය 116 ක් විය. ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පැවති තනතුරු 47න් 21ක් පුරප්පාඩුව පැවැති අතර බඳවා ගෙන තිබුණු තනතුරු 26 න් 20 ක් සඳහාම ද්විතීයන පදනම මත බඳවා ගෙන තිබුණි. මීට අමතරව, තෘතීයික හා ද්විතියික	කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අත්‍යාවශ්‍ය සීමිත තනතුරු කීපයක් සඳහා පමණක් බාහිරින් බඳවා ගැනීමට 2024 වර්ෂයේ දී අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව එම තනතුරු සඳහා සුදුසු නිලධාරින් බඳවා ගැනීමට කටයුතු කර ඇත. එලෙසම අනෙකුත් අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා ද කළමනාකරණ	අත්‍යවශ්‍ය සේවකයින් ස්ථිරව හා අනෙකුත් සේවකයින් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත යුතුය.

මට්ටමේ නිලධාරීන් 31ක් ද ද්විතීයන පදනම මත බඳවාගෙන තිබුණි. ද්විතීයන පදනම මත බඳවාගෙන තිබුණු නිලධාරීන් වසර දෙකකින් ආයතයෙන් ඉවත්ව යාම හේතුවෙන් නැවත නැවත නිලධාරීන් බඳවා ගැනීමට සිදුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු, උපදේශකවරුන් 07 දෙනෙකු ඇතුළු නිලධාරීන් 15 දෙනෙකු ආයතනයෙන් ඉවත්ව ගොස් තිබුණු අතර, උපදේශකවරුන් 06 දෙනෙකු ඇතුළු නිලධාරීන් 18 දෙනෙකු ද්විතීයන පදනම මත බඳවා ගෙන තිබුණි.	සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇත.	

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීමට ආයතනය කටයුතු කළයුතු වුවත් විධායක නොවන සේවාවලට අයත් සේවා 03ක නිලධාරීන් 348ක් පුහුණු කිරීමේ සේවාරම්භක පුහුණු වැඩසටහන් 03ක් සහ විධායක සේවාවන්ට අයත් සේවා 04ක නිලධාරීන් 1,241ක් පුහුණු කිරීමේ සේවාරම්භක හා ධාරිතා සංවර්ධන වැඩසටහන් 12ක් පමණක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කර තිබුණි.	අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය සේවා පුහුණු ආයතනය නැවත ස්ථාපිත කොට විධායක නොවන නිලධාරීන් පුහුණු කිරීම භෞතිකව පැවැත්වීම සාකච්ඡා මට්ටමේ පවතී. ආයතනය විසින් සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් මාර්ගගත ක්‍රමයට පුහුණු කිරීමට කටයුතු කරමින් පවතින අතර පළාත් මට්ටමින් විධායක නොවන නිලධාරීන් සඳහා සිදු කරනු ලබන පුහුණු පාඨමාලාවන්ට අවශ්‍ය සම්පත් දායකයින් පුහුණු කිරීම සඳහා "පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්" පැවැත්වීමටත් සැලසුම් කර ඇත.	ආයතනයේ අරමුණු අනුව රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු දීපව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් 360 ක් පුහුණු කිරීමේ වැඩසටහන් 12 කින් 07	2024 වර්ෂයේ දෙවන හා තෙවන කාර්තුවන්හි ඇති වූ ගංවතුර ආපදා තත්ත්වය සහ අවසන් කාර්තුවෙහි පවත්වන ලද ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණයන් නිසා	ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කළ කාර්යයන් වර්ෂය තුළදී ක්‍රියාත්මක කර අපේක්ෂිත කාර්යසාධන මට්ටම ළඟා

	ක් පවත්වා නොතිබුණු අතර, දීපව්‍යාප්ත සේවා දෙකක නිලධාරීන් 221 ක් පුහුණු කිරීමේ වැඩසටහන් 07 ක මොඩියුල ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සියයට 8-17 ත් අතර පැවතුණි. තවද, විධායක නිලධාරීන් 900 ක් පුහුණු කිරීමේ කෙටිකාලීන පුහුණු වැඩසටහන් 30 ක් ද, නිලධාරීන් 200 ක් සඳහා මුදල් අයකර පවත්වනු ලබන ඩිප්ලෝමා පාඨමාලා 06 ක් ද, නිලධාරීන් 60ක් සඳහා මුදල් අයකර පවත්වනු ලබන සිංහල හා දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලා 02 ක් ද ආරම්භ කර නොතිබුණි. වර්ෂය තුළ පැවැත්විය යුතු නිලධාරීන් 450 ක් පුහුණු කිරීමේ වැඩමුළු 05 ක් ද පවත්වා නොතිබුණි.	විශේෂ ශ්‍රේණියේ නිලධාරින්ගේ රාජකාරියේ යෙදීමේ අවශ්‍යතාවය හේතුවෙන් පුහුණු සඳහා කැඳවීම සිදු නොකළ හෙයින් පුහුණු වැඩසටහන් 05ක් පමණක් පැවැත්වීමට සිදු විය. 2025 වර්ෂයේදී පාඨමාලාවන් නැවත සමාලෝචනය කරමින් නිලධාරින් සඳහා එම පාඨමාලාවන්හි වැදගත්කම සැලකිල්ලට ගනිමින් ඉදිරි වැඩසටහන් සැලසුම් කිරීමට කටයුතු කරනු ඇත.	කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුළත් ඇස්තමේන්තුගත පිරිවැය රු.18,700,000 ක් වූ සූර්ය පැනල සවි කිරීම, අලුත්වැඩියා, ප්‍රතිනිර්මාණය හා ප්‍රතිසංස්කරණයට අදාළ කාර්යයන් 05ක් සහ ඇස්තමේන්තුගත පිරිවැය රු.11,750,000 ක් වූ යටිතල පහසුකම් හා මෘදුකාංග සංවර්ධනය යටතේ වූ ක්‍රියාකාරකම් 05ක් ද ක්‍රියාත්මක කර නොතිබුණි.	සූර්ය පැනල පද්ධතිය සම්බන්ධ BOQ / තාක්ෂණික ලියවිලි සකස් කිරීමේදී විවිධ තාක්ෂණික ගැටළු මතුවීම හේතුවෙන් විදුලිබල මණ්ඩලය (කොළඹ දකුණ) ශාඛාව වෙතින් අනුමැතිය විමසා යවා ඇත. එම අනුමැතිය ලැබීමෙන් පසුව අදාළ BOQ / තාක්ෂණික ලියවිලි සකස් කර එම කාර්යය මෙම වසරේදී සිදු කිරීමට ක්‍රියාත්මක වේ. නුවරඑළිය සංචාරක බංගලාවේ අභ්‍යන්තර නාන කාමර හා බංගලා භාරකරුගේ නේවාසික කාමරය සහිත ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. ආයතන පරිශ්‍රයේ භූමි අලංකරණ කටයුතු මේ වන විට ආයතනයේ සේවයේ නියුතු උද්භිත විද්‍යාව සම්බන්ධ විශේෂඥ දැනුමක් සහිත ජ්‍යෙෂ්ඨ උපදේශකවරයෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් ආරම්භ කර ඇත.	ප්‍රායෝගික තත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කළ යුතු අතර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය.